// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2415/65 - 2024 දෙසැම්බර් මස 20 වැනි සිකුරාදා - 2024.12.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2024/65

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

අයි.ඩී.විජේමාන්න මිය, අංක 8/295, කෝන්ගහමුල, පලාපත්වල, මාතලේ

සහ

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය, අංක 17, මලලසේකර මාවත, කොළඹ 07

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද ,

කම්කරු අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා ) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ගාල්ල, කොහොම්බන්වත්ත, අංක 66/2 ඒ, එච්. ආර්. එල්. සුගතදාස මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මහාචාර්ය **අනිල් ජයන්ත ප්‍රනාන්දු**
කම්කරු අමාත්‍ය

2024 දෙසැම්බර් මස 11 වැනි දින
කොළඹ දී

මාගේ අංකය: IR/ COM/01/2024/65

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

අයි.ඩී.විජේමාන්න මිය, අංක 8/295, කෝන්ගහමුල, පලාපත්වල, මාතලේ

සහ

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය, අංක 17, මලලසේකර මාවත, කොළඹ 07

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ

“පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ සේවයේ නියුතු අයි. ඩී.විජේමාන්න මිය MA - 4 වැටුප් තලයේ නොපිහිටුවීමෙන් ඇයට අසාධාරණයක් සිදුවී තිබේද, යන්නත් එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම්, ඇයට හිමිවිය යුතු සහන කවරේ ද සහ කවරදා සිට ද යන්නත් පිළිබඳ ව වේ.’’

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර**
කම්කරු කොමසාරිස් ජනරාල්

2024 දෙසැම්බර් මස 09 වැනි දින
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී

EOG12– 0208

---

මගේ අංකය: IR/COM/03/2023/199

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

කේ. සුගත් මුතුකුමාරණ මහතා ඇතුළු 11 දෙනා, අංක 329/5/1, ජයෝදා මාවත, හබරකඩ, හෝමාගම.

සහ

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන

වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බත්තරමුල්ල, පැලවත්ත, සිංහපුර පාර, අංක 117, සිරි සිංගප්පුලි මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මහාචාර්ය **අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2023/199.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

කේ. සුගත් මුතුකුමාරණ මහතා ඇතුළු 11 දෙනා, අංක 329/5/1, ජයෝදා මාවත, හබරකඩ, හෝමාගම.

සහ

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,**

"ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවය කරනු ලබන කේ. සුගත් මුතුකුමාරණ මහතා ඇතුළු පහත නම් සඳහන් පැමිණිලිකරුවන් 11 දෙනාට 2005.10.18 දින සිට නිසි වැටුප් පරිමාණයන්හි නොපිහිටුවා එම වැටුප නොගෙවීම මගින් අසාධාරණයක් සිදුව තිබේ ද, යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේනම්, හිමිවිය යුතු සහනයන් කවරේ ද, කවරදා සිටද, යන්නත් පිළිබඳ වේ."

1. එම්. කේ. ලක්ෂ්මි චන්ද්‍රිකා
2. දීපිකා එන්. හිත්තැටියගේ
3. ප්‍රදීපිකා අබේසුන්දර
4. බී. එම්. පී. බස්නායක
5. එම්. සී. එම්. යහියා
6. බි. එම්. ඒ. ඒ. සේනාරත්න
7. බී. ඩී. එස්. ජී. අමරසේකර
8. ජී. අයි. ඩී. පී. කේ. ඩී. ගම්මන්පිල
9. කේ. එස්. මුතුකුමාරණ
10. ඩබ්. එන්. ජයමිණි
11. පී. එච්. එල්. තාමරිකා

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 දෙසැම්බර් මස 04 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 - 0210

මගේ අංකය: IR/COM/02/2023/250.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.08.27 වන දින අංක 2399/24 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.07.26 වැනි දින දරන නියෝගයෙන්,

සී.ආර්.ඩී. පෙරේරා මයා, නො. 14/13, සමිඳු මාවත, පමුණුවිල, ගෝනවල.

සහ

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, නො. 99/1, ජාවත්ත පාර, කොළඹ 05.

අතර පවත්නා 2024.07.23 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් රමාල් අයි. සිරිවර්ධන මයා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු රමාල් අයි. සිරිවර්ධන මයා බේරුම්කාර ධූරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළ යුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2024.07.26 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

මහාචාර්ය **අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය .

2024 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0209/1

---

මගේ අංකය: IR/COM/02/2023/250.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

සී.ආර්.ඩී. පෙරේරා මයා, නො. 14/13, සමිඳු මාවත, පමුණුවිල, ගෝනවල.

සහ

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, නො. 99/1, ජාවත්ත පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පන්නිපිටිය, කඳවල පාර, 55, නීතිඥ බිනර ඒ. ගුණසේකර මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මහාචාර්ය **අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය .

2024 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2023/250

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

සී.ආර්.ඩී. පෙරේරා මයා, නො. 14/13, සමිඳු මාවත, පමුණුවිල, ගෝනවල.

සහ

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, නො. 99/1, ජාවත්ත පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,**

"ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ සේවය කරන සී.ආර්.ඩී. පෙරේරා මහතාට තොරතුරු නිලධාරි තනතුර සඳහා හිමිකමක් තිබේද, එසේ හිමිකමක් තිබේ නම් එය ලබා නොදීම මගින් ඔහුට අසාධාරණයක් සිදුව තිබේ ද, යන්නත් එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳ වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 දෙසැම්බර් මස 02 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 - 0209/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.